www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ෆැසිස්ට්වාදය හා මහ යුදෙව් සංහාරය

## ඩැනියෙල් ගෝල්ඩ්හාගන්ගේ *Hitler's Willing Executioners* "හිට්ලර්ගේ ආසක්ත අලුගෝසුවෝ" කෘතිය පිලිබඳ විවේචනාත්මක විචාරයක්

**Fascism & the Holocaust A critical review of Daniel Goldhagen's Hitler's Willing Executioners**

*පහත පලවන්නේ එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් ඩේවිඩ් නෝර්ත් 1997 අප්‍රේල් 17 දා නැගෙනහිර ලැන්සිග් හි මිචිගන් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ දී පැවැත් වූ දේශනයකි. 1997 මැයි 30 කම්කරු මාවත පුවත්පතේ පලවූ ලිපිය කොටස් හතරකින් මෙහි පලකරමු.*

### පලමු වන කොටස

### හොලෝකෝස්ටය (යුදෙව් සංහාරක මහා වහ්නිය) හා සමකාලීන දේශපාලන විඥානය

තුන් වන රයිකය (Third Reich) නමින් හඳුන්වනු ලැබූ හිට්ලර්ගේ පාලන තන්ත්‍රය බිඳ වැටී ගත වී තිබෙන්නේ අර්ධ ශත වර්ෂයකට නො අඩු කාල පරිච්ඡේදයකි; මනුෂ්‍ය වර්ගයා තව මත් එහි භයංකරත්වයේ හා මුර්ගත්වයේ උරුමය පරාජය කිරීමට ප්‍රයත්න දරමින් සිටී. 1945 වසන්තයේ දී නාසි සමූලඝාතක කඳවුරුවල දොරටු හැර දැමීමත් සමග එලිදරව් කරන ලද මහා ඝාතක දර්ශනයන් මානව වර්ගයාගේ විඥානයෙන් කවර කලෙක වත් මකා නො දැමෙනු ඇත. එහෙත් ඕෂ්විට්ස්, ට්‍රෙබ්ලින්කා, බර්ගන්-බෙල්සන්, බුකන්වෝල්ඩ් සහ ඩචෝහි කරන ලද මානව වර්ග විරෝධී අපරාධ කවර කලෙක වත් අමතක නො කිරීම පමනක් සෑහෙන්නේ නැත. එම අපරාධවල අර්ථභාරය හා ඇඟවීම් වටහා ගැනීම ඊට නො අඩුව ප්‍රානභූත වැදගත් කමක් ගනී.

මෙහි දී අපි භයංකර ගැටලුවකට මුහුන දෙමු: හොලෝකෝස්ටය (යුදෙව් සංහාරක මහා වහ්නිය) පිලිබඳව කොතරම් දේ කියනු ලැබුව ද ලියනු ලැබුව ද එය තවමත් පවතින්නේ පුදුමාකාරව ආවරනය කරනු ලැබුවක් ලෙස ය. හොලෝකෝස්ටය පිලිබඳව අනුභූතික දත්තයන් අතිවිශාල ප්‍රමානයක් එක්රැස් කර ඇති බව සත්‍ය ය. නාසීන් තමන් විසින් යෝජනා කර ගැනුනු "අන්තිම විසඳුම" හෙවත් යුරෝපීය යුදෙව්වන් හය කෝටියක් මරා දැමීම සංවිධානය කොට ක්‍රියාත්මක කල අන්දම ගැන සවිස්තර තොරතුරු අපට තිබේ. එහෙත් හොලෝකෝස්ටය යන නම් ලත් මේ දෙය වටහා ගැනීමට කේන්ද්‍රීය වූ ගැටලු - එහි ඓතිහාසික උල්පත්, දේශපාලන හේතු සහ අවසාන වශයෙන් විසි වන සියවසේ ඉතිහාසයේ එයට අයත් තැන - ගැන ප්‍රයත්න කිහිපයක දී හැර, විග්‍රහ කොට තිබෙන්නේ ඉතා දුර්වල ආකාරයකට ය. හොලෝකෝස්ටය විසින් ඉස්මතු කර ඇති තනි මූලික ප්‍රශ්නය වන "එය සිදුවුයේ මන්ද?" යන්නට උත්තරයක් ලබා ගැනීම වඩාත් දුෂ්කර වී ඇත.

"හොලෝකෝස්ටය කෙතරම් භයංකර සිද්ධියක් දැයි කිව හොත් එය කිසිසේත් ම තර්කානුකූලව පැහැදිලි කල නො හැකි ය." යන තර්කය මගින් මෙම තර්කය තර්කාපනය කොට යුක්තියුක්ත කරනු ලැබේ. ඇඩොර්නෝ ප්‍රකාශ කල ආකාරයට ඕෂ්විට්ස්හි ඝාතනවලින් පසු කවි ලිවීම කල නො හැකි වී නම්, මිනිසාගේ සමාජ - නැතහොත්, වඩාත් නිවැරදිව කීවොත් සමාජ විරෝධී - කටයුතු දුවවන්නා වූ බලවේගයන් වටහා ගැනීමට ඉතිහාසඥයාට පවතින හැකියාව කෙරේ එතරම් විශ්වාසයක් තැබීම ද තව දුරටත් නොහැකි බව සිතිය හැකිය. මෙවන් අගාධ නපුරක් ඉදිරියේ ඓතිහාසික විද්‍යාව හා දේශපාලන න්‍යාය අසරන බවක් පෙනී ගියේ ය.

ඒ අනුව, මෙම අදහස දරන්නවුන්ට ආර්ථික පදනම්, පන්ති ව්‍යුහයන් හා තුන් වන රයිකය එලඹීමට පෙර ජර්මානු හා යුරෝපීය සමාජයේ දේශපාලන අරගලයන් හැදෑරීමක් තුලින් දිනාගත හැකි එතරම් වැදගත් දෙයක් තිබුෙනේ නැත. හොඳට ම වැඩි වුවහොත් එවන් විද්‍යාත්මක හා භෞතිකවාදී ප්‍රවිෂ්ටයක් ලබා දෙනු ඇත්තේ, මිනිසාගේ ආත්මය හා මනසේ ගැඹුරට කා වැදුනු මානව දුෂ්ඨත්වයේ බලවේග අනිවාර්යයෙන් ම විය යුතු පරිද්දෙන් ම ඉස්මත්තට පැමින ශිෂ්ටාචාරයේ සංයමික සදාචාර බලපෑම් මත ආධිපත්‍යය පිහිටුවාගත්, ආකස්මික සමාජ පසුබිමකි.

1950 ගනන්වල දී ලියන ලද එක්තරා නවකථාවක් මනුෂ්‍යත්වය පිලිබඳ අඳුරු දර්ශනයක් පෝෂනය කලේ ය. මානව වර්ගයාගේ ස්වභාවික තත්ත්වය ම්ලේච්ඡත්වය යයි තර්ක කල විලියම් හෝල්ඩිං ලියු *Lord of the flies* (මැස්සන්ගේ අධිපතියා) යන

නවකථාව ඔබ බොහෝ දෙනෙකුට සුපුරුදු යයි මට විශ්වාස ය. සාමාන්‍ය පාසල් ළමුන් කන්ඩායමක් ශිෂ්ටාචාරයේ සාමාන්‍ය සංයමික බැම්වලින් මුදා හැරියොත්, ඔවුන් ජනඝාතක ම්ලේච්ඡ තත්ත්වයක් කරා, හොඳට ම වැඩි වුවහොත් සති කිහිපයක් තුල, ප්‍රතිගමනය කරනු (ආපසු යනු) ඇත. මෙම මානව-විරෝධී කෘතිය උපන්නේ හෝල්ඩිං දෙවන ලෝක යුද්ධයේ අත්දැකීම්වලින් උකහා ගත් නිගමන තුලිනි. "මීමැස්සා මීපැනි නිෂ්පාදනය කරන්නේ යම් සේ ද මිනිසා නපුර නිෂ්පාදනය කරන්නේ ද එසේ ම ය යන්න වටහා නො ගෙන මෙම කාල පරිච්ඡේදය තුලින් ගමන් කලා වූ ඕනෑම කෙනෙක් එක්කෝ අන්ධ විය යුතු ය, නැත හොත් ඔහුගේ ඔලුව නරක් විය යුතු ය"(1) යනුවෙන් ඔහු පසුව ලිවී ය.

*ලෝර්ඩ් ඔෆ් ද ෆ්ලයිස්* නම් කෘතියේ ජනප්‍රියත්වය දෙවන ලෝක යුද්ධයේ මහා භීතීන් විසින් නගාලන ලද මංමුලාව හා අපේක්ෂාභංගය පිලිබිඹු කලේ ය. මෙම මානසිකත්වය යුද්ධයෙන් පසු සමයේ පැන නැගි දේශපාලන සබඳතා විසින් ශක්තිමත් කරන ලදී. ඇත්ත වශයෙන් 1945ට පෙර කාලයට වඩා 1945 න් පසු කාලයේ දී තුන් වන රයිකයේ ස්වභාවය පිලිබඳව වෛෂයික සාකච්ඡාවක යෙදීම උගහට විය. සීතල යුද්ධයේ-ප්‍රතිගාමී වාතාවරනය තුල, විශේෂයෙන් ම එක්සත් ජනපදයේ දී ෆැසිස්ට්වාදය ද නූතන ධනවාදය ද අතර සම්බන්ධතාව ගැන උවමානාවට වඩා බරපතල ලෙස විග්‍රහ කිරීම උචිත යයි තව දුරටත් නො සලකන ලදී.

1930 ගනන්වල දී දේශපාලන වැටහීමකින් යුතු හා පන්ති විඥාන උදවිය පලමු වන ලෝක යුද්ධයෙන් පසුව ෆැසිස්ට්වාදය පැන නැගීම වනාහී පෘථුල සමාජවාදී කම්කරු ව්‍යාපාර නිසා ධනේශ්වර සමාජය මුහුන පා සිටි විප්ලවවාදී අන්තරායන්ට ධනේශ්වර සමාජය දැක් වූ ප්‍රතිකර්මය බව වටහා ගෙන සිටියහ. ෆැසිස්ට්වාදය යනු වියරු වැටුනු මධ්‍යම පන්තිය දේශපාලනිකව සමාජවාදී කම්කරු පන්ති ව්‍යාපාරයට එරෙහිව ධනවාදයේ අවශ්‍යතාව උදෙසා ප්‍රතිවිප්ලවවාදී ලෙස බලමුලු ගන්වා ගැනීම බව, මුසෝලිනිගේ ඉතාලිය, හිට්ලර්ගේ ජර්මනිය හා ෆ්‍රැන්කෝගේ ස්පාඤ්ඤය උවමනාවටත් වඩා හොඳින් පැහැදිලි කර තිබුනි. ෆැසිස්ට්වාදය බලයට පත් වූ තන්හි, කම්කරු පන්තිය සංවිධිත දේශපාලනික හා සමාජ බලවේගයක් ලෙස පැවැත්ම අවසන් විය.

1930 ගනන්වල දී වටහා ගනු ලැබුවේ ධනවාදය සහ ෆැසිස්ට්වාදය අතර සම්බන්ධතාව පමනක් නොවේ. මධ්‍යම පන්තීන් විනාශභාග් කොට ෆැසිස්ට්වාදයේ හස්තය යටට ඇද දැමූ ලෝක ධනේශ්වරයේ අර්බුදය යුදෙව්වන් සමූලඝාතනය කිරීමට තර්ජනය කල බව ද ලෝකය පුරාම සමාජවාදියෝ පෙන්වා දී අනතුරු හැඟවූහ.

1940 දී ලියොන් ට්‍රොට්ස්කි ලියූ පරිදි: විදේශීය වෙලඳාම වියැකී යන්නා වූ ද දේශීය වෙලඳාම පිරිහී යන්නා වූ ද කාල පරිච්ඡේදය ඒ සමඟ ම ජාත්‍යාත්තමවාදය ද විශේෂයෙන් ම යුදෙව් විරෝධය ද උග්‍ර වන්නා වූ කාලය ද වන්නේ ය. ධනවාදය පැන නැගි යුගයේ දී, එය යුදෙව් ජාතිය ඔවුන් සිරවී සිටි ගෙටෝවලින් එලියට ගෙන තම වානිජ ප්‍රසාරනයේ උපකරනයක් ලෙස යොදා ගත්තේය. අද දිරාපත් වන ධනවාදය තමන්ගේ සෑම සිදුරකින්ම එලියට යුදෙව් ජාතිය ඇද දැමීමට යත්න දරයි. ලෝකයේ සිටින්නා වූ බිලියන දෙකක ජනගහනයෙන් සියයට එකකට අඩු වූ දහහත් මිලියන ජනකායකට තව දුරටත් අපගේ ග්‍රහ ලෝකය මත ඉන්නට තැනක් ලබා ගත නොහැකිය. යෝධ භූමි ප්‍රසාරනයන් ද මිනිසාට මහ පොලව මෙන්ම අහස් කුසත් දිනා දී ඇති තාක්ෂනයේ භාස්කම් ද මැද ධනේශ්වර පන්තිය අපගේ ග්‍රහලෝකය ජරා සිර ගෙයක් බවට පත් කර ගෙන සිටී." (2)

එක්සත් ජනපද ආන්ඩුවේ පවත්නා දේශපාලන අවශ්‍යතා විසින් ෆැසිස්ට්වාදයේ පන්ති පදනම් හා දේශපාලන අරමුනු පිලිබඳ අවංක සාකච්ඡාවක් වලකාලනු ලැබූ තාක් දුරට, බුද්ධිමය රික්තයක් - ෆැසිස්ට්වාදය, තුන් වන රයිකයත්, හොලෝකෝස්ටයත් පිලිබඳ අනෛතිහාසික වූ ද තරයේ ම අවිද්‍යානුකූල වූ ද සංකල්පයක් කා වැදී පැතිරී යාම ධෛර්යමත් කරන්නා වූ බුද්ධිමය රික්තයක් - නිර්මානය කෙරුනි. මෙය ජන විඥානය කෙරේ දුර දිග යන විපාක ඇති කලේ ය. එහි ඓතිහාසික හා දේශපාලන සන්දර්භයෙන් ඉරා වෙන් කර දැමූ හොලෝකෝස්ටය වටහා ගත නොහැකි දෙයක් බවට පත් කරන ලදී. හොලෝකෝස්ටය පිලිබඳ මහජන විඥානය වඩවඩාත් ගසා කන සන්ත්‍රාසවාදය ලාභ සදාචාරාත්මක සුලභවාචක හා අස්තිත්වවාදී විලාපයන් ද විසින් හැඩ ගස්සන ලදී.

හොලෝකෝස්ටයෙන් කිසියම් පාඩමක් උකහා ගනු ලැබිනි නම් ඒ මිනිසා - යන්තම් හෝ අවස්ථාවක් ලදොත් - කිව නොහැකි මෘගත්වයට පත් වීමට සමත් බවයි; මනුෂ්‍යයන් සය මිලියනයක් අමු අමුවේ මරා දැමීමෙන් පසු මිනිසාගේ ප්‍රගතිය ද, මිනිසා පරිපූර්නත්වයට පත් කල හැකිය යන්න ද පිලිබඳව විශ්වාස කිරීම මිත්‍යාවක් බවයි. මේ ආකාරයෙන් ගත් කල හොලෝකෝස්ටය යුක්ති සහගත කරන ලද්දේ පශ්චාත් යුද කාලීන පවත්නා තත්ත්වය යුක්ති සහගත කිරීමට ය. වඩා හොඳ ලෝකයක් සඳහා අරගලය වැලැක්වීමට ය.

පසුගිය 50 වර්ෂය තුල විද්‍යානුකූල වටිනාකමකින් යුතු කෘතීන් නිෂ්පාදනය කර නැතැයි කියා සිටීමට මම නො කැමැත්තෙමි. නාසි පාලන තන්ත්‍රයේ ද හොලෝකෝස්ටයේ ද විවිධ අංගයන් පිලිබඳ ප්‍රශස්ත කෘතීන් ගනනාවක් නිෂ්පාදනය කරනු

ලැබ තිබේ. එහෙත් එවන් ප්‍රශස්ත ඉතිහාසඥයන්ගේ පර්යේෂන පොදු ජන මනසට බලපා ඇත්තේ යන්තමිනි. එවන් කෘතීන් විශේෂයෙන් ම එක්සත් ජනපදය තුල, සාමාන්‍යයෙන් පරිශීලනය කරනු ලබන්නේ අදාල ක්ෂේත්‍රයේ විශේෂඥයන් විසින් ම පමනි.

නූතන දේශපාලන-ඓතිහාසික විඥානයේ අවපාත මට්ටමට අවධානය යොමු කිරීම සඳහා පමනක් වුව ද පහත සඳහන් කරුනට අවධානය යොමු කිරීමට මට අවසර දෙනු මැනවි. ජර්මානු ෆැසිස්ට්වාදයේ යෝධ අන්තරාය ද විනාශකාරී ශක්‍යතාව ද ලියෝන් ට්‍රොට්ස්කි තරම් වෙන මොනයම් මැ මිනිසෙකු විසින් වත් පැහැදිලිව වටහා ගනු නො ලැබූ නමුත් සමකාලීන ඓතිහාසික ශාස්ත්‍රීය කෘතීන් තුල නාසිවාදය පිලිබඳව 1930-1934 සමයේ ඔහුගේ ලේඛන සම්බන්ධයෙන් මොනයම් මැ හෝ සඳහනක් වත් ගැනීම අතිශයින් ම දුෂ්කර ය.

ඉමහත් ම ආකර්ෂනය අත් කර ගන්නේ ඉතාම පහත් අගතීන්ට හා සාවද්‍ය සංකල්පයන්ට අභියෝග නො කරන නැතහොත් සත්තකින් ම ශක්තිමත් කරන ඒවා ම ය. අතිශයින් ම ප්‍රචලිත වූ ද, තදින් ම හෙලා දැකිය යුතු වූ ද *හිට්ලර්ගේ ආසක්ත අලුගෝසුවෝ : සාමාන්‍ය ජර්මානුවන් සහ හොලෝකෝස්ටය* නම් ඩැනියෙල් ගෝල්ඩ්හාගන්ගේ කෘතිය මෙම ගනයට අයත්ය.

## ගෝල්ඩ්හාගන්ගේ තර්කය

ගෝල්ඩ්හාගන්ගේ පොතේ ප්‍රධාන තේමාව පහසුවෙන් ම සාරංශ ගත කල හැකිය. ඒ අනුව හොලෝකෝස්ට් හෙවත් හිට්ලර් විසින් යුදෙව් ජාතිකයන් දශ ලක්ෂ ගනනක් අමු අමුවේ මරා දැමීමට හේතුව සොයා ගත හැක්කේ ජර්මානු ජාතිකයන්ගේ මානසික හැඩගැස්ම හා විශ්වාසයන් තුල ය. මහා ජාතික සාමූහිකයක් වූ ජර්මන් ජනයා, සුවිශේෂයෙන් ජර්මානු වූ යුදෙව් - විරෝධී දෘෂ්ටියකින් මෙහෙය වී ජර්මානු ව්‍යාපාරයක්, එනම් හොලෝකෝස්ටය නිර්මානය කලහ. මෙසේ යුදෙව්වන් ක්‍රමානුකූලව හා මහා පරිමානව මරා දැමීම, ඉඩ ලද සියලුම ජර්මානු ජාතිකයන් සතුටෙන් හා උනන්දුවෙන් සහභාගි වූ ජාතික විනෝද ක්‍රීඩාවක් බවට පත් විය.

ගෝල්ඩ්හාගන්ට අනුව ජර්මානුවන් ඝාතනයේ යෙදුනේ, ඔවුන් ජර්මානුවන් ලෙස, සමනය කල නොහැකි වූ ජර්මානු යුදෙව්-විරෝධයකින් මෙහෙයවුනු බැවිනි. යුදෙව්වන් කෙරේ වෛරය ජර්මන් ජනයාගේ ලෝක දෘෂ්ටිය හෙවත් වෙල්ටාන්ෂෝන්ග්හ් (weltanschauung) පදනම වූයේ ය. මේ පිලිබඳව පාලන තන්ත්‍රයේ දේශපාලනය දැරුවේ ද්විතීයික වැදගත් කමක් පමනක් යයි ගෝල්ඩ්හාගන් කියයි. "නාසීන්" සහ "එස් එස් කාරයන්" (විශේෂ නාසි මැර බලකාය) වැනි පද වනාහි ඝාතකයන් ගැන සඳහන් කරන කල පාවිච්චි නොකල "අනුචිත ලේබල්" යයි ද, ගෝල්ඩ්හාගන් කියා සිටී. තුන් වන රයිකය සහ යුදෙව්වන් ඝාතනය කිරීම අතර එකම සාරභූත හේතුඵල සබඳතාව වූයේ එය විසින් ජර්මානු ජාතිකයන්ට නිදැල්ලේ වැඩට බැස, ජර්මානු විශ්වාසයන්ට අනුකූලව ක්‍රියා කිරීමට ඉඩ සලසා දීම පමනි.

ගෝල්ඩ්හාගන් මෙසේ ලියයි: "හොලෝකෝස්ටයට සම්බන්ධ වූ ජර්මානුන්ට ඉතාම උචිත නම පමනක් නො ව, එකම උචිත හා පොදුවේ ගැලපෙන නම නම් 'ජර්මානුවන්' යන්න ය. ඔවුහු ජර්මනියේ නාමයෙන් ද එහි අතිශයින් ම ජනප්‍රිය නායකයා වූ ඇඩොල්ෆ් හිට්ලර්ගේ නාමයෙන් ද ක්‍රියාත්මක වූ ජර්මානුවන් ම වූහ." (6 වන පිටුව)

ගෝල්ඩ්හාගන්ගේ අරුම පුදුම ප්‍රතිවේදනයන්ගේ (සබිසටයජී) ධාරාවෙන් අවධානය ඉවතට යොමු නො වනු වස් හිට්ලර්මත් ඕස්ත්‍රියානු ජාතිකයෙක් ය යන කරුන හෝ ඔහුගේ වර්ගවාදී න්‍යායයන් දහනව වන සියවසේ ජීවත් වූ ප්‍රන්ස ජාතික ගොබිනෝ නම් වංසක්කාරයාගේ ය යන්න හෝ, ඔහුගේ දේශපාලන වීරයා වූ මුසෝලිනි ඉතාලි ජාතිකයෙකු ය යන්න හෝ, ඔහුගේ ප්‍රධාන දෘෂ්ටිවාදඥයා වූ රොසෙන්බර්ග් බෝල්ටික් ප්‍රදේශයේ ජනිත වූ කෙනෙක් ය යන්න හෝ, ඔහුගේ සමීපතම සගයා වූ රුඩොල්ෆ් හෙස් ඊජිප්තුවේ උපන්නෙක් ය යන්න හෝ, යනාදී මෙම කරුනු ගැන දිගින් දිගටම කතා නොකරන්නෙමි.

මෙවන් කරදරකාරී පරස්පර විරෝධයන්ගේ ගම්‍යයන් ගැන සිතනවා වෙනුවට, අපි ඉක්මනින් ම ගෝල්ඩ්හාගන්ගේ නිගමනයන් කරා ගමන් කරමු:

"යුදෙව්-විරෝධය දහස් ගනන් සාමාන්‍ය ජර්මානුවන් යුදෙව්වන් මරා දැමීම කරා මෙහෙය වූ බව ද ඊට ඉඩ ලැබෙන තත්ත්වයකට පත්ව තිබුනි නම් තවත් දශ ලක්ෂ සංඛ්‍යාවක් ජර්මානුවන් ද ඒ සඳහා මෙහෙය වීමට යුදෙව් විරෝධයට හැකිව තිබුනු බව ද නිරායුධ, අසරන යුදෙව් මිනිසුන්, ගැහැනුන් සහ දරුවන් දහස් ගනනින්, ක්‍රමානුකූලව හා නිර්දය ලෙස මරා දැමීමට මෙහෙයවාලූයේ ආර්ථික දුෂ්කරතාව නොව, සාර්වාධිකාරී රාජ්‍යයක බලාත්කාරය නො ව, පුද්ගලයන්ගේ මානසික හැඩගැස්මේ අනිවාර්ය නැමියාවන් නො ව, දශක ගනනාවක් ම ජර්මනිය පුරා පැතිරගොස් තිබුනා වූ යුදෙව් ජනයා පිලිබඳ මතාන්තරයන් ය." (9 වන පි.)

කාන්ටියානු ඥාන විභාගයේ කථෝර අර්ථකථනයන් යොදා ගන්නා, ගෝල්ඩ්හාගන් යුදෙව් විරෝධය ජර්මානුවන්ගේ ඥාන යන්ත්‍රනයේ අභේද්‍ය මුලු මනින්ම පාහේ පූර්ව-දත්ත (කල්තබා ම පිහිටියා වූ) සංරචකයක් (අංගයක්) යයි තර්ක කරයි. යුදෙව්-විරෝධී ඇදහිල්ල සාරභූත වශයෙන් ම ජර්මනිය තුල අනභියෝගී ආධිපත්‍යයක් දැරී ය" යි හේ ලියයි. (33 වන පි.)

## ගෝල්ඩ්හාගන්ගේ ක්‍රමවේදය

ගෝල්ඩ්හාගන්ගේ තර්ක සත්‍ය කාරනා උඩ පදනම්ව ඇත්තේ කොතරම් දුරට දැයි මම තව ටිකකින් පරීක්ෂා කර බලමි. එහෙත් ප්‍රථමයෙන්, ඔහුගේ චින්තන විධික්‍රමය සහ විශ්ලේෂනය ගැන නිරීක්ෂන කිහිපයක් කිරීමට කැමැත්තෙමි.

ග්‍රාම්‍ය චින්තනයේ ඉතාම පොදු ලක්ෂනය වනාහි සංකීර්න හා බොහෝ පැති ඇති යථාර්ථය, උවමනාවට වඩා පුලුල් වූ, අරූපී, ඒකපාක්ෂික නිර්වචනයන් මගින් අතිසරල කිරීම ය. විද්‍යාත්මක චින්තනය යත්න දරන්නේ සෑම ප්‍රපංචයක්ම සමන්විතව ඇති විවිධ හා ප්‍රතිවිරුද්ධ අංග ඒවායේ පොදු අන්තර් ක්‍රියාව තුල හඳුනාගෙන අනන්‍ය කර ගැනීමට ය. සිය මනස තුල පිලිබිඹු කර ගන්නා යථාර්ථයේ සංකීර්න භාවය හෙවත් පරස්පර විරෝධී ස්වභාවය ප්‍රකාශිත කිරීම සඳහා සංකල්පයක් වර්ධනය කිරීමට විද්‍යාඥයා උත්සාහ කරයි.

අනෙක් අතට ග්‍රාම්‍ය චින්තනය, තමන් විශ්ලේෂනය කිරීමට සිතා ගන්නා වූ ප්‍රපංචයේ ව්‍යුහය සමන්විත වන අභ්‍යන්තර පරස්පර විරෝධයන් නොතකා හරිනසුලු හිස් සාමාන්‍යකරනයන්හි එල්බෙයි. දර්ශනවාදයේ දී එවන් හිස් සාමාන්‍යකරනයන් හඳුන්වනු ලබන්නේ, වියුක්ත අනන්‍යයන්, එනම් සියලු අභ්‍යන්තර විවිධතා ඉවත් කර දමන්නා වූ අනන්‍යයන් ලෙසය. ඒවා වියුක්ත යන වචනයේ නරක අර්ථයෙන් වියුක්තය, මන්ද යත්, ඒවා යථාර්ථය පිලිබඳ නොසැහෙන මානසික නියෝජනයන් වන හෙයිනි. භෞතික ලෝකය එවන් අභ්‍යන්තරිකව අනීර්නිත (වෙන් කර නො ගැනුනු) ප්‍රපංචයන්ගෙන් සරලව ම සමන්විත වන්නේ නැත.

සෑම "අනන්‍යයක් ම" එතුල වෙනස (විවිධත්වය) දරා සිටී. ග්‍රාම්‍ය චින්තනයේ මූලික වැරැද්ද ගලා එන්නේ මෙතැනිනි. ග්‍රාම්‍ය චින්තනය පරිහරනය කරන්නේ පහත් ම වර්ගයට අයත් ඒකපාක්ෂික සංකල්පයන් ය; යථාර්තය පිලිබඳ විද්‍යාත්මක හා සත්‍ය නියෝජනයක් සම්පාදනය කිරීමට අසමත් වියුක්ත අනන්‍යයන් ය.

මහාචාර්ය ගෝල්ඩ්හාගන්ගේ කෘතියේ ක්‍රමවේදය පිලිබඳ දුබලතාව එහි නමෙන් ම පෙන්නුම් කෙරෙ යිඃ *හිට්ලර්ගේ ආසක්ත අලුගෝසුවෝඃ සාමාන්‍ය ජර්මානුවන් සහ හොලොකෝස්ටය*. අපි මෙතැන ම නවතිමු. "සාමාන්‍ය ජර්මානුවන්" යනුවෙන් හඳුන්වනු ලබන්නේ කවුරුන් ද? "වියුක්ත අනන්‍යයක්" පිලිබඳ පාඨ ග්‍රන්ථමය (ඉතා සරල හා පැහැදිලි) උදාහරනයක් දැක බලා ගැනීමට ඔබ අතුරෙන් කවුරුන් හෝ කැමති නම් මෙන්න. මෙය කොතරම් පුලුල් ප්‍රවර්ගයක් දැයි කිව හොත්, යුදෙව් දෙමව්පියන් ඇති ජර්මානුවන් හැර, සෑම කෙනෙක් ම ඇතුලත් කර ගැනීමට සමත් ය. සුවිශේෂ ජර්මානු ජාතිකයෙකු "සාමාන්‍ය ජර්මානු ජාතිකයෙකු" බවට පත් කරන්නේ කුමක් විසින් ද? තරබාරු බවක් නිසා සිදුවන්නක් ද? නොක්වුර්ස්ට් හෝ සේවර්බ්‍රෙස්ට් වැනි ආහාර වර්ගවලට දක්වන කැමැත්තක් නිසා සිදුවන්නක් ද? එය රන්වන් කෙස් ද, නිල්වන් ඇස් ද, සෙලුවෙන් ඉරුරැස් තැපීමට ඇති ආශාවක් ද? එය ගුඪ ලෙස දාර්ශනික තර්කවල යෙදීමට ඇති දක්ෂතාවක් ද? වැග්නේරියානු සංගීතයට නැම්, රාත්තල් 300 බරැති, උච්චස්වර ගායකයන්ට ඇති ආශාවක් ද? එවන් මෝඩ, සහ හිතුවක්කාර ඒකාකාරයන් මත ගොඩනැගුනු සංකල්පයකට වෛෂයික යථාර්ථය ඥානනය කිරීමේ දී කිසියම් විද්‍යාත්මක වටිනාකමක් තිබිය නො හැකි ය.

එහෙත් අපි අපේ නිර්වචනය තුලට වඩා බරපතල සමාජ විද්‍යාත්මක ගුනාංග ඇතුලත් කිරීමට උත්සාහ කලොත් "සාමාන්‍ය භාවය" පිලිබඳ සංකල්පය කිසිදු වටිනාකමකින් තොර බව වහාම පෙනී යයි. 1933 දී ජර්මානු සමාජයට සංකීර්න පන්ති ව්‍යුහයක් තිබුනි. හිට්ලර් බලයට පැමිනි අවස්ථාවේ සිටි "සාමාන්‍ය ජර්මානු ජාතිකයා" ෆැක්ටරි කම්කරුවෙක් ද? නට්ටම් කඩකාරයෙක් ද? ලුම්පන් කම්කරුවන් අතර අපේක්ෂාභංග එකෙක් ද? තදින් නය ගැති වූ ගොවියෙක් ද? නැතහොත් ප්‍රශියාවේ ඉඩම් හිමි යුන්කරයෙක් ද? කර්මාන්ත කුවේරයෙක් ද?

විවිධාකාර සමාජ ස්තරයන්ට අයත් වූ මේ සියලුම දෙනා "සාමාන්‍ය ජර්මානුවන්" යයි එකට ගොඩ ගසනු ලැබුව හොත් ඉන් සරලව ම ඇඟවෙන්නේ "සාමාන්‍යතාව" පිලිබඳ සංකල්පය 1933 දී පැවැති ආකාරයෙන් ජර්මානු සමාජයේ පැවති අභ්‍යන්තර ප්‍රතිසතිතා පිලිබිඹු කරන්නේ නැති බව ය. එහෙයින් ගෝල්ඩ්හාගන් පාඨකයාට ඉදිරිපත් කරන්නේ 1933 දී සමන්විතව තිබුනු ආකාර ජර්මානු සමාජය පිලිබඳ විද්‍යාත්මක විශ්ලේෂනයක් නො ව, ඒ වෙනුවට - කියන්නටත් අප්පිරියා වුව ද - වර්ගය සහ ලෙය වශයෙන් නීර්නිත වූ ඒකාබද්ධ ජර්මානු ජනතාවක් පිලිබඳ නාසි මිත්‍යා පුරාවෘත්තය අවිවේචනාත්මක ව යුක්ති සහගත කරන්නා වූ, සමජාත සමාජයක් පිලිබඳ පරමෝත්කෘෂ්ට පින්තූරයකි.

"සාමාන්‍ය ජර්මානුවා" පිලිබඳ මෙම සංකල්පය තම සම්පූර්න විශ්ලේෂනයේ පදනම ලෙස ගන්නා ගෝල්ඩ්හාගන්ට, එම ඒකාකාර සංකල්පයේ වලංගු බව ප්‍රශ්නයට භාජන කරන්නා වූ සියලු දේ ම, සියලු පුද්ගලයන් ම තම පොතෙන් වෙන් කර දැමීමට සිදු වෙයි. *ඩර් එවිග් ජූඩ්* (der ewige jude) හෙවත් සදාකාලික යුදෙව්වා පිලිබඳ නාසීන් මවාගත් අවතාරයට ඔහු ඉදිරිපත් කරන පිලිතුර වන්නේ, යුදෙව් ජනතාවගේ නිර්දය හා නො වෙනස් වන සතුරා වූ සදාකාලික ජර්මානුවා ය. (*ඩර් එවිග් ඩොච්* - der ewige Deutsche)

ජර්මානු ජාතිකයා සහ යුදෙව් ජාතිකයා අතර භේදය මිස වෙන මොන ම ආකාරයක හෝ අභ්‍යන්තර විවිධායනකින් තොර ජාතියක් ප්‍රතිෂ්ඨා කරන ගෝල්ඩ්හාගන්ට ඒ සඳහා සැබෑ ඉතිහාසයකින් තොර ජාතියක් ප්‍රතිෂ්ඨා කිරීමට ද සිදු වේ. හිට්ලර් බලයට පත් වීමට පෙර අවුරුදු සියය තුල ජර්මානු වර්ධනය නිර්නය කලා වූ සිද්ධීන් හා පුද්ගලයන් පිලිබඳ මොන ම සඳහනක් කිරීමක් හෝ මෙහි නැත.

ගෝල්ඩ්හාගන්ගේ පොතේ සමාජවාදී ව්‍යාපාරය මුලුමනින් ම පෙනෙන්නට ම නැතුවාක් මෙනි. පිටු 622ක් තිබෙන මෙම පොතේ කාල් මාක්ස්, ෆ්‍රෙඩ්රික් එංගල්ස්, ෆර්ඩිනන්ඩ් ලසාල්, ඕගස්ට් බෙබල් හෝ විල්හෙල්ම් ලීබ්නෙහ්ට් පිලිබඳ මොන ම සඳහනක් වත් ඇත්තේ නැත. බිස්මාක් පාලනය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ 1878-90 ප්‍රති-සමාජවාදී නීති ගැන වචනයක් වත් සඳහන් කර නැත. ඉතිහාසයේ ප්‍රථම මහජන පක්ෂය වූ ද 1912 වන විට ජර්මානු රයික්ස්ටාගයේ (පාර්ලිමේන්තුවේ) වැඩිම ආසන ගනනක් දිනා ගෙන සිටියා වූ ද, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ගැන සඳහන් කර ඇත්තේ යන්තමිනි. 1918 විප්ලවය හෝ ස්පාටකස් ලීගේ නැගිටීම පිලිබඳ සඳහනක් වත් මෙහි නැත.

මෙම මග හැරීම අමතක වීමක් යයි සිතිය නො හැකි ය. තමාගේ න්‍යාය පිලිබඳ සම්පූර්න නිෂේධනයක් ජර්මානු සමාජවාදී ව්‍යාපාරය විසින් පෙන්නුම් කෙරෙන නිසා ඔහුට ජර්මානු සමාජවාදී ව්‍යාපාරය විග්‍රහ කල නො හැකි ය. එහෙත් ජර්මානු සමාජවාදී කම්කරු ව්‍යාපාරය පැන නැගීම පිලිබඳව පරීක්ෂා නොකර, වත්මන් යුදෙව්-විරෝධයේ ස්වභාවය හා අර්ථභාරය කිසිසේත් ම වටහා ගත නො හැකි ය.

**අධෝසටහන් :**

01. ඇන්ඩෘ මයිකල් රොබට්ස්, *The Novel: From Its Origins to the Present Day* (නවකථාවː එහි සම්භවයන්ගේ සිට අද දක්වා), (ලන්ඩන්ː බ්ලූම්ස්බරි,1993), 173 පි.

02. *Documents of the Fourth International: The Formative Years 1933-40* (හතර වන ජාත්‍යන්තරයේ ලියවිලිː ආරම්භක අවුරුදු 1933-40) (නිව් යෝර්ක්ː පාත්ෆයින්ඩර්, 1973) 312 පි.

© www.wsws.org